# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
# காணி, காணி அபிவிருத்தி அமைச்சு
# Ministry of Land and Land Development

"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල. "கொவிஜன மந்திரய", 80/5, ரஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date

ඉඩම් 4.1 අංක චක්‍රලේඛ
චක්‍රලේඛ අංක 2009-01

2009.04.0

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## ඉඩම් පිළිබඳ කාර්ය භාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැනවී ඇති ප්‍රතිපාදන අනුව රජයේ ඉඩම් පිළිබඳ පූර්ණ අයිතිය ජනරජය සතුවන අතර යම් ඉඩමක් නියාදනය කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33ඩී වගන්තිය යටතේ ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පවතින බවද අවධාරණය කරමි.

පළාත් සභා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව ඉඩම් සම්බන්ධව බලය පැවරීමේදී ඉඩම් යන විෂය පළාත් සභා ලැයිස්තුවට ඇතුළත් කර ඇති නමුත් එහිදී එම විෂය පළාත් සභා ලැයිස්තුවට ඇතුලත් කර ඇත්තේ යම් ව්‍යතිරේකයන්ට යටත්වය. එබැවින් යම් පළාතක් තුළ මෙම කාර්යයන් ඉටුකල යුත්තේ පහත සඳහන් උපලේඛනයට අනුකූලවය.

## උපලේඛනය :-

1. සංචෘත හෝ සමගාමී විෂයයන් සම්බන්ධයෙන් ආණ්ඩුවේ කාර්ය සඳහා අවශ්‍ය රජයේ ඉඩම්, ආණ්ඩුව විසින් එම කාරනය පාලනය කෙරෙන නීතිවලට අනුකූලව ප්‍රයෝජනයට ගනු ලැබිය යුතුය. එම ඉඩම් එම විෂය සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව ආණ්ඩුව විසින් අදාළ පළාත් සභාව විමසිය යුතුය.(11 පරිශිෂ්ටය 1.1)

2. සෑම පළාත් සභාවකටම පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වී ඇති එම පළාත ඇතුළත ඇති රජයේ ඉඩම් ආණ්ඩුව විසින් ලබාදිය යුතුය. පළාත් සභාව විසින් එම රජයේ ඉඩම් එම කාරනය පාලනය කෙරෙන නීති හා ප්‍රඥප්තිවලට අනුකූලව පරිපාලනය කිරීම, පාලනය කිරීම සහ ප්‍රයෝජනයට ගැනීම කළයුතුය. (11පරිශිෂ්ටය 1.2)

3. පළාතක් ඇතුළත ඇති රජයේ ඉඩම් යම් පුරවැසියෙකුට හෝ සංවිධානයකට පවරාදීම හෝ නියාදනය කිරීම අදාළ පළාත් සභාවේ උපදේශය මත එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූලව ජනාධිපතිවරයා විසින් සිදුකළ යුතුය.

4. අන්තර්පළාත් වාරිමාර්ග කටයුතු සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් වගකීම ශ්‍රී ලංකා ආණ්ඩුව සතු විය යුතු අතර, ඒ ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළයුතුය.

5. පළාත් සභා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා ඒ ඒ පළාත් සභා විසින් ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය කෙරෙහි නිසි පරිදි සැළැකිලිමත්ව එම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

එහෙත් ඇතැම් විට මෙම සීමා කිරීම් නොසලකා හැර ක්‍රියා කරන අවස්ථා ඇති බව මට අනාවරණය වී ඇත. යම් පළාත් සභාවක් ඉඩම් විෂය සම්බන්ධ බලතල ක්‍රියාත්මක කිරීමේදී ප්‍රඥප්තියක් මඟින් විධිවිධාන සලසා ගෙන තිබුනේ වුවද එම ප්‍රඥප්තියේ විධිවිධාන ඉහත කී ව්‍යතිරේඛය තුළින් ජනරජය වෙත රඳවා ගෙන ඇති කාර්ය භාරයන් හා බලයට හානිකර නොවන පරිදි ක්‍රියාත්මක විය යුතුවේ.

ඒ අනුව යම් ඉඩමක් බැහැර කිරීමේදී හෝ බැහැර කිරීම සඳහා ඉල්ලුම් කිරීමට හිමිකමක් ලැබිය හැකි පූර්ව ක්‍රියාදාමයන්හිදී එනම්, බලපත්‍රදීම වැනි ක්‍රියාවන්හිදී ඉහත කී විධිවිධාන සඳහා විශේෂයෙන් සැලකිලිමත්ව ක්‍රියා කරන ලෙස අවධාරණය කරමි.

අත්සන් ර.වී. දිසානායක
ලේකම්
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

පිටපත්:-

1. ජනාධිපති ලේකම්
2. ඉඩම් කොමසාරිස් ජනරාල්
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
4. සියලුම පළාත් සභා ඉඩම් ලේකම්වරුන්
5. සියලුම පළාත් සභා ඉඩම් කොමසාරිස්වරුන්